# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.03.26 පැය 1255 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 581 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## ත්‍රිරෝද රථ හා යතුරුපැදි සොරකම් කිහිපයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - කුලියාපිටිය පොලිස් ස්ථානය.

2025.03.20 වන දින කුලියාපිටිය නගරයේ දී කුලියාපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර ත්‍රිරෝද රථ හා යතුරු පැදි සොරකම් කිහිපයකට අවශ්‍ය කරන සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන නාරම්මල පොලිස් වසමේ පොතුගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු විසින් කුලියාපිටිය, කුරුණෑගල, නාරම්මල, පොල්ගහවෙල, අලව්ව හා මාරවිල යන පොලිස් වසම් වලින් සොරා ගන්නා ලද ත්‍රිරෝද රථ 13 ක් හා යතුරු පැදි 07 ක් පොලිසිය විසින් සොයා ගෙන ඇත.

සැකකරු 2025.03.21 වන දින කුලියාපිටිය ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර වැඩිදුර විමශර්න සඳහා රැඳවුම් නියෝග ලබාගෙන ඇති අතර 2025.03.27 වන දින නැවත ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූප





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**